කුස්තිරම

ඩී බී කුරුප්පු

මේ ලිපිය ලියන්නට මා යොමු වූයේ ගිය අවුරුද්දේ නොවැම්බර් 16 වැනි දා ජගත් ජේ එදිරිසිංහ කළ ප්‍රකාශයක් නිසා ය. ජගත් එම ප්‍රකාශය ඉදිරිපත් කළේ මගේ පොත් එළි දැක්වීමකදී මගේ පරිවර්තන කෘති ගැන කතා කරන අතර ය. මගේ පරණ පොතක් වූ "අර්ධනාරි" ගැන සඳහන් කළ ඔහු එයට වර්ෂයේ හොඳම පරිවර්තනය වශයෙන් සම්මානය හිමි විය යුතුව තිබුණද එසේ නොවූයේ විනිශ්චයකරුවන් පරිවර්තනයට තෑගි නියම කරන්නේ මුල් කෘතිය දිහා බලාගෙන නිසා විය යුතු යයි ද කීවේ ය.

ශ්‍රී ලංකාවේ පළවන සාහිත්‍ය කෘති කියවීමේ අවස්ථාව මට වඩා ඔහුට ලැබෙන බවත් මම දනිමි. ඔය කියන අවුරුද්දේ හොඳම පරිවර්තනයට හිමි වන න්‍යාගය දිනා ගත්තේ ඉංගිරිසි ලේඛක ජෝර්ජ් ඕර්වෙල් ලියූ "1984" සිංහල පරිවර්තනයට බව දැන සිටියද මම සිංහල පොත කියවීමට උනන්දුවක් නොදැක්වීමි. ඉංගිරිසි පොත් කියවා තිබුණු නිසා ය.

ජගත් ගේ කතාව අස සිටි තරුණයෙක් මගේ කුතූහලය තවත් නැංවාලීමට සමත් විය. කෙටිකතාකරුවකුද වන මේ තරුණයා මගේ පොත පමණක් නොව "1984" සිංහල පරිවර්තනයද කියවූවෙකි. 1984 අර්ධනාරි පොතට කිට්ටු කරන්නටවත් බැරි යයි ඔහු කීවේ එම අවබෝධය පදනම් කොට ගෙන ය. එපමණක් නොවේ 1984 පරිවර්තකයාගේ පොත් කිහිපයක්ම කියවා ඇති මේ තරුණයා තවත් කරුණක් අවධාරණය කළේ ය. මෙම ලේඛකයා එනම් ආරියවංශ රණවීර මෙතක පරිවර්තනය කළ පොතක තත්වය ඉතා හොඳ වුවත් 1984 පරිවර්තනයේ ඒ ගැම්ම නැති බව ය.

1984 සිංහල පොත සොයාගෙන කියවීමට මා අදහස් කළේ මේ පසුබිම නිසා ය. පොත කියවන්නට ලැබුණේ 2009 සාහිත්‍ය මාසය උදා වන්නට ඔන්න මෙන්න කියා ය. පොත කියවූ පසු පියදාස වැලිකන්නගේ සාහිත්‍ය දින උත්සවය ගැන ලියූ ලිපිය ද දුටු මට නමසිය හැත්තෑ ගණන් වල පොළොන්නරුවේ (කදුරුවෙල) පැවැත්වුණ සාහිත්‍ය උත්සවය සිහිපත් විය. මම එදා කතාවක්ද පැවැත්වීම් වීට කලින් දෙවසරක්ම කෙටිකතා තේරීමේ වගකීම මටත් පැවරිණි. එක් වතාවක මා මුල් තේරූ පොතට තෑගි ලැබුණේ නැත. එහෙත් මම අවසන් තීරණය පිළිගතිමි. එය ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක තීර්දේශ මත ගන්නා ලද්දකි. තේරුණු පොත ද උසස් තත්වයේ වූවකි.

කෙටි කතා තේරූ විදිය ගැන දැන සිටියත් පරිවර්තන තෝරන මිනුම් දඬු හෝ පදනම මට තේරෙන්නේ නැත . ඒ නිසා මට සිදුවන්නේ නුදෙක් අනුමානයෙන් ඒ ගැන කීමට ය.

යට කී මගේ පරිවර්තනය ගැන වර්ණනාවක් කිරීමටවත් තෑගි දීනූ ආරියවංශ හෑල්ලු කරන්නටවත් මට වුවමනාවක් නැත. මා නොහඳුනන එම පරිවර්තකයා අතිදක්ෂ කවියකු බවත් හරබර ලිපි ලියන ලේඛකයකු බවත් මම දනිමි. මට වක් මගින්ද අනුග්‍රහයක් දක්වූවකු නිසා ඔහුට ණයගැති ද වන්නෙමි.

එහෙත් ඔහුගේ පරිවර්තනය පදනම් කොට ගෙන පරිවර්තනයක අගය මගින්නේ කෙසේද යන ප්‍රශ්නය මතු කිරීමට අදහස් කරමි. අද දවසේ ශ්‍රී ලංකාවේ පාඨකයන් අතර පරිවර්තන කෘති ජනප්‍රියව පවත්නා හෙයින් ප්‍රශ්නය වඩාත් කලෝචිත බව කියමි.

මගේම මිනුම් දඬුවක් සකස් කරගෙන ප්‍රශ්නය දෙස බලමි. පරිවර්තනයක අගය රඳා පවතින්නේ මුල් කෘතියේ අදහස සපුරා දෙවැනි බසට ඇතුළත් වුවහොත් පමණි. මා එසේ කියන්නේ නොතේරෙන තැන් නොහොත් අමාරු තැන් මග හරිමින් පරිවර්තනය කිරීමත් මුල් කෘතියේ සාරාංශය සිංහලෙන් ලිවීමත් ඉද හිට සිදුවන නිසා ය. විශේෂයෙන්ම සාහිත්‍ය කෘතියකින් කර්තෘ පාඨකයා වෙත පිරිනැමීමට අදහස් කළ රසාස්වාදයට හරස් වීමට පරිවර්තකයාට අයිතියක් නොමැති හෙයිනි.

මෙහිලා ඉංගිරිසි නොහොත් මුල් බස පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් පරිවර්තකයාට තිබීම අත්‍යවශ්‍ය ය. අනෙක් අතට මුල් බසින් ඉදිරිපත් කරන අදහස් නිවැරදිව පැහැදිලිව සිංහලෙන් ඉදිරිපත් කිරීමට සිංහල දැනුමද තිබිය යුතු ය. මෙම දෙවැනි අවශ්‍යතාව අවධාරණය නොකළ යුත්තකැයි කෙනකු කීමටද ඉඩ ඇත. එහෙත් එසේ සිතීම නිසාම එහි වැදගැම්ම පෙන්වා දිය යුතු ය.

මුල් පොතේ අදහස් සපුරා යටහා ගත්තකුට වුවත් එය සාර්ථක අන්දමින් සිංහලෙන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය දැනුම පමණක් නොව ඉවසීම සහ සංවරය ද තිබිය යුතු ය.

ඉවසීම යනුවෙන් මා අවධාරණය කරන්නේ යම් වැකියක් හෝ වැකි කීපයක් සිංහලට පරිවර්තනය කිරීමේ දී එක් වරටම අපේක්ෂිත ප්‍රතිඵලය ලද නොහැකි නිසා ය. මා කළ සමහර පරිවර්තනයක එකම ඡේදය දෙතුන් වතාවක් ලියූ හැටි මට මතක් වෙයි. සමහර විට පරිවර්තනය හමාරකොට දෙවැනි වතාවට කියවන විට අදහස හරි හැටි ග්‍රහණය නොවූ බව අනාවරණය වන්නේ ය. එබඳු අවස්ථාවක නැවත වතාවක් ලිවීමට සිදුවෙයි.

සංයමය යන්නෙන් මා අදහස් කරන්නේ මුල් කෘතියේ අදහස ග්‍රහණය කර ගැනීමෙන් පසු එය සිංහලෙන් ඉදිරිපත් කිරීමේ දී බස හැසිරවීම ගැන ය. බස නිරවුල් විය යුතු ය. නිවැරදි විය යුතු ය. ඒ සමගම තවත් ලක්ෂණයක්ද අත්‍යවශ්‍ය ය. බස සුගම විය යුතු ය. පරිවර්තනයකැයි කියන්නට බැරි තරමට ඇසට කණට හුරු බස් වහරක් විය යුතු ය. කොටින්ම පරිවර්තිත කෘතියේ අසිංහල ගතියක් කොහෙත්ම නොතිබිය යුතු ය. සිංහල පාඨකයාට එයින් පූර්ණ ආස්වාදයක් ලද හැක්කේ එවිටය.

පර්වර්තනය සඳහා වාර්ෂික සාහිත්‍ය සම්මානය හිමි කර ගන්නා කෘතිය මෙකී අවශ්‍යතාවන් සපුරා ලිය යුතු යයි මම කියමි. මා යට කී පරිවර්තනය එනම් 1984 දෙස විපරම් නෙත යොමු කරන්නේ එමස් ආචාරයේ පිහිටා ය.

පොතේ පිටු පනහක් පමණ කියවීමේ දී මා දුටු ලක්ෂණ සමහරක් පෙන්වා දෙමි. පළමු කොට අසිංහල විදියට මට පෙනී ගිය තැන් කිහිපයක්.

- (වින්ස්ටන්) එක් වරම රවුම් ගමනින් ඉහළට නැංගේ ය.
- නිරන්තරයෙන් සෝදිසි අක්ෂිය යොදමින් සිටිනවා වෙන්නට පිළිවන.
- ගොරිල්ලාවන් වැනි රොදු මුහුණු ඇති.
- හිටි ගමන් මහත් බියකින් මෙන් ඔහු ලිවීම ඇරඹීය.
- ඉන්පසුව ඒ කඩදාසිය කෙහෙන්දෝ හමා ආ උනුසුම් සුළං දහරකට හසුවී ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයේ දැල්වෙමින් තුබූ ගිනි ජාලාවලට මැදිවී අඟුරු බවට පත්විය.
- වෙරය කුළු මුදුනටම නැග්ගේ දෙවැනි විනාඩියේ ය.

බස හැසිරවීමේ සංවරයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසින් සම්මත මූලික වියරණ රීති අනුගමනය කළ යුතුය. උක්තාඛ්‍යාත සම්බන්ධය රැකීම මෙහිලා මූලික වන්නේ ය. මේ පරිවර්තනයේ එය නොරැකෙන තැන් කිහිපයක් පමණක් දක්වමි.

- ඔබයන් උස් සිරුරක් සහිත මහත දෙහත මිනිසකු විය.

Graphic Thought by Saamantha Tennege

පරිවර්තනයට ඩොලර්ලක්ෂ සාහිත්‍ය සම්මානයක්

- මිනිසුන් තමන් සිටි තැන්වල සිට .... හඬට ඉහළින් බෙරිහන් දුන්හ.
- උන් සැවොම පාලනය කළ නොහැකි වනචාරීන් බවට පත්වී සිටියහ.
- දිය පහරේ පොක්කලම් වල විලෝ තුරු සෙවනේ ඩේස් මාලුවන් පිහිනමින් සිටියහ.

උක්තානුක්ත ඡේදය තැකීමද මූලික අවශ්‍යතාවකි. මෙහිලා පෙනී යන දුබලතා කිහිපයක් මෙසේ ය.

- සියුළුම ළමෝ දඩබ්බරයෝ බවට පත්ව පත්වී සිටියහ.
- ... යමෙක් "අපි අඳුරු දුරුවුණු තැනකදී හමුවෙමු" කියන හඬක් ඔහුට ඇසිණ.

අක්ෂර වින්‍යාසය ද ගරු කළ යුතු බව කල්පනා කරතත් මේ පොතේ ඒ ආංශය ගැන සඳහන් නොකරමි.

පරිවර්තනයක් විනිශ්චය කිරීමේදී මා යොදා ගන්නා මිනුම් දඬු යට කී සම්මාන තීරණය කිරීමෙහි ලා අනුගමනය කරන්නට ඇද්දැයි කිව නොහැකිය. මගේ ප්‍රශ්නය වනුයේ ඉන් බැහැර කිසියම් සාධකයක් ඔවුන්ගේ විනිශ්චයට පාදක විද යන්නය.

හොඳම පරිවර්තනය වශයෙන් තෝරා ගන්නා කෘතියට තෑගි ලැබෙනවා පමණක් නොවේ. සෙසු පරිවර්තකයන් විසින් ආදර්ශයට ගනු ලැබිය යුතු සම්මතයක් පිහිටුවන්නක්ද විය යුතු

ය. ඒ ගැන නොසිතන්නේ නම් වෙනත් කරුණක්

8 වන පිටුවට

ඔබේ උත්සව අවස්ථාවට
Hennessy Catering Services
රස ගුණ පිරි ආහාර සපයන්නේ
බුරියානි
කහ බත්
ෆ්‍රයිඩ් රයිස්
ආප්ප
කොත්තු
වෙනත් ඕනෑම කෑමක්

ලොකු පොඩි ඕනෑම භාදයකට උත්සවයකට
15 Hennessy St Epping 3076
Tel 03 8320 3932
Mobile 0432 721 967